චතාරික සමය තුන්වන ඉරුදින

## දේව ප්‍රකාශන

03-03-13

**පළමුවන කියැවීම**

නික්මයාම 3:1-8, 13-15

නික්මයාම පොතෙන් ගත් පාඨයකි.

**"මම වනාහි ස්වයම්භූ නම් තැනැන් වහන්සේ වෙමි."**

මෝසෙස් තම මාමණ්ඩිය වූ මිදියන්හි පූජක තැන වන ජෙත්රෝගේ එළු බැටළු පට්ටි රැකබලාගනිමින් සිටියේ ය. ඔහු ඒ පට්ටි පාළුකරය හරහා දක්කාගෙන ගොස්, හොරෙබ් නම්, දෙවියන් වහන්සේගේ කන්දට පැමිණි කල, සමිඳුණන් වහන්සේගේ දූතයා පඳුරක් මැදින් නැඟුණු ගිනි ජාලාවක ආකාරයෙන් ඔහුට දෘශ්‍යමාන විය. ඔහු බැලූ විට පඳුර ගින්නෙන් ඇවිළී ගිය නමුත් එය නොදැවෙන බව දිටී ය. මෝසෙස්, "මෙය පුදුමයකි. මම දැන් ඊට ළං වී, පඳුර නොදැවෙන්නේ මන්ද කියා බලමි"යි තමාට ම කියාගත්තේ ය. ඔහු එය බලන පිණිස ඊට ළං වන බව සමිඳුණන් වහන්සේ දුටු විට, දෙවියන් වහන්සේ පඳුර මැදින්, "මෝසෙස්, මෝසෙස්" කියා ඔහුට හඬගැසූ සේක. ඔහු ද, "මම මෙහි ය"යි කීවේ ය. එවිට දෙවියන් වහන්සේ කතා කොට, "මෙතැනට ළං නොවන්න. නුඹේ පාදවලින් වහන් ගලවාදමන්න. නුඹ සිටින ස්ථානය ශුද්ධ භූමියෙකැ"යි වදාළ සේක. තවදුරටත් උන් වහන්සේ කතා කරමින්, "නුඹේ පියාගේ දෙවියන් වහන්සේ මම ය, ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ද මම ය"යි වදාළ සේක. මෝසෙස් ද දෙවියන් වහන්සේගේ මුහුණ දෙස බැලීමට බිය වූ බැවින් තම මුහුණ වසාගත්තේ ය. සමිඳුණන් වහන්සේ ඔහුට කතා කොට මෙසේ වදාළ සේක: "මිසරයේ සිටින මාගේ සෙනඟගේ දුක්ඛිත තත්ත්වය මම දිටිමි. ඔවුන්ගේ විධායකයන්ට විරුද්ධ ව නඟින මොරගැසීමට මම සවන් දුනිමි. ඔවුන්ගේ දුක් වේදනා මම හොඳින් දනිමි. මිසර ජාතීන්ගේ අතින් ඔවුන් මුදා, ඒ රටින් ඔවුන් පිට කරවා, සාරවත් විශාල දේශයකට, කිරෙන් හා මී පැණියෙන් ඉතිරෙන දේශයකට, එනම් කානානිවරුන්ගේ හා හිත්තීවරුන්ගේ ද අමෝරිවරුන්ගේ හා පෙරිස්සිවරුන්ගේ ද හිවීවරුන්ගේ හා ජෙබුසිවරුන්ගේ ද දේශයට ඔවුන් පමුණුවාලීම සඳහා මම බැස ආවෙමි. එවිට මෝසෙස් දෙවියන් වහන්සේට කතා කොට, "එසේ නම් මා, ඉශ්රායෙල් සෙනඟ වෙත ගොස්, 'නුඹලාගේ පියවරුන්ගේ දෙවියන් වහන්සේ මා නුඹලා වෙත එවූ සේකැ'යි කී විට, ඔවුන් ද, 'උන් වහන්සේගේ නම කුමක් ද'යි මාගෙන් අසන කල මම ඔවුන්ට කුමක් කියම් ද"යි ඇසී ය. උන් වහන්සේ මෝසෙස්ට පිළිතුරු දෙමින්, "මම වනාහි ස්වයම්භූ නම් තැනැන් වහන්සේ වෙමි. 'ස්වයම්භූ තැනැන් වහන්සේ ඔබ වෙත මා එවූ සේකැ'යි නුඹ ඉශ්රායෙල් ජනයාට කිව යුතු ය"යි වදාළ සේක. තවදුරටත් උන් වහන්සේ මෝසෙස්ට කතා කරමින්, මෙසේ වදාළ සේක: " 'ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ද වන නුඹලාගේ පියවරුන්ගේ දෙවි සමිඳුණන් වහන්සේ ඔබ වෙත මා එවූ සේකැ'යි කිව යුතු ය. සදහට ම මෙය මාගේ නාමය වේ. මතු සියලු පරම්පරාවෝ මේ නාමයෙන් මට ආමන්ත්‍රණය කරති."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 103:1-4, 6-8, 11

පිළිතුර: සමිඳුණෝ අනුකම්පාවෙන් හා දයාවෙන් පරිපූර්ණ ය.

ගීය: මාගේ සිත, සමිඳුන් පසසන්න. හද පත්ලෙන් ම එතුමන්ගේ ශුද්ධ නම පසසන්න. මාගේ සිත, සමිඳුන් පසසන්න. එතුමන්ගේ සියලු උපකාර අමතක නොකරන්න.

එතුමාණෝ මාගේ සියලු පාප කමා කරන සේක. මාගේ සියලු රෝග සුව කරන සේක. මාගේ ජීවිතය පාතාල ලෝකයෙන් මුදාලන සේක. ප්‍රේමය හා දයාව නමැති කිරුළෙන් මා සරසන සේක.

සමිඳුණෝ සාධාරණ ලෙස ක්‍රියා කරන සේක. පීඩිතයන්ට එතුමාණෝ යුක්තිය ඉටු කරන සේක.

සමිඳුණෝ ස්වකීය මාර්ග මෝසෙස්ටත්, තම බලවත් ක්‍රියා ඉශ්රායෙල් සෙනඟටත් දැක් වූ සේක.

සමිඳුණෝ අනුකම්පාවෙන් හා දයාවෙන් පරිපූර්ණ ය. නොකිපෙන සුලු ය. අතිශයින් කරුණාවන්ත ය. මන්ද, පොළොවට ඉහළින් අහස උස් ව තිබෙන්නාක් මෙන් එතුමාණන් කෙරෙහි ගරුබිය පාන අයට එතුමාණන්ගේ කරුණාව මහත් ය.

## දෙවන කියැවීම

1කොරින්ති 10:1-6, 10-12

ශුද්ධ වූ පාවලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටාගත් කොටසකි.

**මේ සිදු වූ සියල්ල ලියන ලද්දේ අපට පාඩමක් වශයෙනි.**

සහෝදරවරුනි, අපේ පියවරුන්ට කුමක් වී ද යි ඔබට මතක් කර දීමට මම කැමැත්තෙමි. ඔව්හු සියල්ලෝ ම වලාකුළක මඟ පෙන්වීම ලැබූ හ. ඔව්හු සියල්ලෝ ම රතු මුහුදින් එතෙර වූ හ. සියල්ලෝ ම වලාකුළක ද රතු මුහුදෙහි ද මෝසෙස් සමඟ සහභාගිකමට බව්තීස්ම-ස්නාපනය ලැබූ හ. සියල්ලෝ ම එක ම දිව බොජුන් වැළඳූ හ. සියල්ලෝ ම එක ම අමා පැන් පානය කළහ. ඔවුන් පානය කෙළේ ඔවුන් කැටුව ගිය දිව්‍ය පර්වතයකින් ය. ඒ පර්වතය නම් ක්‍රිස්තුන් වහන්සේ ය. එහෙත් දෙවියන් වහන්සේ ඔවුන්ගෙන් වැඩි දෙනෙකු ප්‍රිය නොකළ සේක. එබැවින් ඔව්හු කාන්තාරයෙහි දී විනාශ වූ හ. ඔවුන් නපුරු දෙයට ඇලුම් කළාක් මෙන්, අපත් නපුරු දෙයට ඇලුම් නොකරන පිණිස, මේ සියල්ල සිදු වූයේ අපට පාඩමක් වශයෙනි. ඔවුන්ගෙන් සමහරෙකු මැසිවිලි කීවාක් මෙන් මැසිවිලි නොකියන්න. මැසිවිලි කීමෙන් ඔව්හු මාර දූතයා විසින් විනාශ කරනු ලැබූ හ. මේ සියල්ල සිදු වූයේ ඔවුන්ට පාඩමක් වන පිණිස ය. ඒවා ලියන ලද්දේ යුගාන්තයට පැමිණ සිටින අපට අනතුරු ඇඟවීමක් වශයෙනි. තමා ස්ථිර ව සිටින්නේ යයි සිතන්නා නොවැටෙන ලෙස පරෙස්සම් වන්න.

දේව වාක්‍යය එසේ ය.

දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** මතෙව් 4:17

"මනස්ථාපනය වන්න. ස්වර්ග රාජ්‍යය ආසන්න ය" යි
ජේසුස් ස්වාමීන් වහන්සේ වදාළ සේක.

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 13:1-9

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**මනස්ථාපනය නොවූවොත් ඔබ හැම ද විනාශ වන්නහු ය.**

එක් අවස්ථාවෙක එහි සිටි සමහරෙක් කතා කොට, පිලාත් විසින් ගලීලයන් මරා ඔවුන්ගේ ලේ ඔවුන්ගේ ම යාග සමඟ මිශ්‍ර කළ අන්දම ගැන ජේසුස් වහන්සේට දැන්වූ හ. උන් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, "ඒ ගලීලයන් එබඳු විපතක් වින්ද බැවින් ඔව්හු අන් හැමට ම වඩා පාපී වූ හ යි ඔබ සිතන්නහු ද? එසේ නොවේ ය යි මම ඔබට කියමි. මනස්ථාපනය නොවූවොත් ඔබ හැම ද එසේ ම විනාශ වන්නහු ය. සිලෝවම් හී බලකොටුව වැටී ඊට යට වී මළ දසඅට දෙන ජෙරුසලමෙහි විසූ අන් හැමට ම වඩා දුෂ්ට වූ හ යි ඔබ සිතන්නාහු ද? එසේ නොවේ ය යි ඔබට කියමි. මනස්ථාපනය නොවූවොත් ඔබ හැමට වන්නේත් එම විපත්තිය ම ය"යි වදාළ සේක. උන් වහන්සේ උපමාවක් වදාරමින්, "එක් මිනිසකුගේ මිදි වත්තෙහි වැඩුණු අත්තික්කා ගසක් විය. ඔහු ඒ ගසේ ගෙඩි සොයා ආවේ ය. එහෙත් කිසිවක් සම්බ නො වී ය. එවිට ඔහු උයන්ගොව්වාට කතා කරමින්, 'බලන්න, දැන් අවුරුදු තුනක් ම මේ අත්තික්කා ගසේ ගෙඩි සොයා ආ නමුත් කිසිවක් සම්බ නො වී ය. ගස කපා දමන්න. එය පොළොවට බරක් ව තිබිය යුතු මන්ද'යි කී ය. ඔහු උත්තර දෙමින්, 'ස්වාමීනි, එය වටකර හාරා පෝර දමන පිණිස මේ අවුරුද්දටත් තිබුණා වේ. ඉන්පසු පල දැරුවොත් හොඳ ය. නැති නම් එය කපා දමන්නට පුළුවනැ' "යි කී බව වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.